# මොනිකා රුවන්පතිරණගේ පද්‍ය නිර්මාණයන්හි නිරූපිත මාතෘත්වය

කුසුම් හේරත්
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

## ABSTRACT

නවසිය හැත්තෑවෙන් ආරම්භ වන යුගයේ කාව්‍යකරණයට එළඹුණු මොනිකා රුවන්පතිරණ කිවිඳියගේ නිර්මාණයන්හි සුවිශේෂී ලක්ෂණය නම්, කාන්තාව ඇගේ බොහෝ නිර්මාණයන්හි මුඛ්‍ය තේමාව වීම ය. ඇය ලාංකේය ස්ත්‍රිය හා බැඳුණු විවිධ ගැටලු විග්‍රහ කරනුයේ පෙරදිගට ආවේණික වූ ශිෂ්ට සම්පන්න බව රැක ගනිමිනි.

ස්ත්‍රිය, මවක, බිරිඳක, යෙහෙළියක හා දියණියක වශයෙන් පරීක්ෂණයට පාත්‍ර කරනු හැරුණු විට ඈ සමස්ත කාන්තාවගේ ආධ්‍යාත්මය නිවැරදි පරිකල්පන ශක්තියකින් අන්‍යයන්ට සමීප කරවීමට ද උත්සුක වෙයි. මෙහි දී මොනිකා රුවන්පතිරණගේ පද්‍ය නිර්මාණ හා බැඳුණු මාතෘත්වය පිළිබඳව අපගේ අවධානය යොමු වේ. කාන්තාව, මවක වීමෙන් පසුව ඇයට මුහුණදීමට සිදුවන විවිධ දුක්ඛදෝමනස්සයන් යථාර්ථවත් දෘෂ්ටියකින් ග්‍රහණය කර ගැනීමට කිවිඳිය යත්න දරයි. විශ්වයේ පැවැත්ම සහතික කරන ප්‍රබල සාධකය මාතෘත්වය වුව ද වැඩි වශයෙන් දෝෂදර්ශනයට, මානසික පීඩනයට පාත්‍ර වන්නී ඇය යි. උක්ත කරුණ විවිධ පැතිකඩ ඔස්සේ යථාර්ථයට සමීප ව ගවේෂණය කිරීමට ඇය උත්සුක වෙයි. මෙම අධ්‍යයනයේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ මොනිකා රුවන්පතිරණ සිය පද්‍ය නිර්මාණ මගින් මාතෘත්වය දෙස හෙළූ දෘෂ්ටිය විමර්ශනය කිරීම යි.